IHP
INSTITUTE FOR HEALTH POLICY

## ශ්‍රී ලංකා අදහස් නිරීක්ෂණ සමීක්ෂණය

## 2021-01

2021 නොවැම්බර් 17 නිකුත් කිරීම සඳහා

# සංක්‍රමණය වීමට අවශ්‍ය ශ්‍රී ලාංකිකයන්ගේ සංඛ්‍යාව වැඩි වීම, විශේෂයෙන් තරුණයින් සහ රජය පිළිබඳ අතෘප්තිමත් වූ ඡන්ද දායකයින්.

*COVID උපාය මාර්ග සහ ආර්ථික අපේක්ෂාවන් පිළිබඳ අතෘප්තිය සමඟ සම්බන්ධ වූ සාධක, නමුත් විපක්ෂය ප්‍රතිලාභ ලබා ගැනීමට අපොහොසත් වේ.*

රවී. පී. රන්නන් එළිය **විසින්**

*මාධ්‍ය විමසීම් සඳහා:*
ඩැල්රින් බාත්ලට්
විද්‍යුත් තැපැල: dalreen `at’ ihp.lk

නිර්දේශිත උපුටා දැක්වීම

Institute for Health Policy, November 2021, “Increasing Numbers of Sri Lankans Want to Migrate, especially Youth and Disenchanted Government Voters”, SLOTS Report #2021-01.

# IHP ශ්‍රී ලංකා අදහස් නිරීක්ෂණ සමීක්ෂණය පිළිබඳව

COVID-19 සුවය ලැබීමේදී මහජන අත්දැකීම් සහ අදහස් නිරීක්ෂණය කිරීම සඳහා IHP ශ්‍රී ලංකා අදහස් එකතු කිරීම පිළිබඳව සමීක්ෂණය (SLOTS) දියත් කරන ලදී. එය පවත්වාගෙන යනු ලබන්නේ ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි ස්වාධීන, පක්ෂග්‍රාහී නොවන පර්යේෂණ මධ්‍යස්ථානයක් වන සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය (IHP) විසිනි. SLOTS ප්‍රධාන විමර්ශකයා වන්නේ IHP හි ආචාර්ය රවී රන්නන්-එලිය යි. ඔහු හාවඩ් විශ්ව විද්‍යාලයේ මහජන මත විමසුම පිළිබඳ පුහුණුව ලබා ඇති අතර දශක තුනක් පුරා විවිධ මත සමීක්ෂණ සිදු කර ඇත.

ශ්‍රී ලාංකීය වැඩිහිටියන්ව නිවැරදිව පිළිඹිබු කිරීමට යොදා ගත් නියැදියක් සඳහා සෑම මසකම දුරකථනයෙන් සම්මුඛ සාකච්ඡාවක් සිදු කර ඔවුන්ගේ වර්තමාන අදහස් සහ තත්ත්වය පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම SLOTS මඟින් සිදු කරයි. සියලුම සම්මුඛ සාකච්ඡා වලට පොදු ප්‍රශ්න මාලාවක් ඇතුළත් වන අතර, කාලීන වැදගත්කමක් ඇති වෙනත් ගැටළු පරීක්ෂා කරන ප්‍රශ්න මාලාවක් තොරා ගත් පිරිසකට පමණක් යොමු කෙරේ. නීලන් තිරුචෙල්වම් භාරය සහ අනෙකුත් අනුග්‍රාහකයින් විසින් මෙම සමීක්ෂණයට අරමුදල් සපයයි. සමීක්ෂණය සඳහා ඒකාකාරී සැලසුමක් ඇති අතර, සමීක්ෂණය දිගටම කරගෙන යාමට, නව ප්‍රශ්න එක් කිරීමට, හෝ දත්ත වලට ගැලපෙන විශ්ලේෂණ සිදු කිරීමට ආයතනය අනුග්‍රහය දක්වයි. වැඩිදුර විස්තර වීමසීම සඳහා ස්ථිර අනුග්‍රාහකයින් ආයතනය හා සම්බන්ධ විය යුතුය.

අහඹු ලෙස ඉලක්කම් යොදා ගනිමින් ලබා ගත් ජංගම දුරකථන ඇමතුම් වලින් තෝරා ගත් පිරිස සහ මීට පෙර ජාතික මට්ටමෙන් සිදු කර තිබෙන සමීක්ෂණයක දී නැවත සමීක්ෂණය කිරීමට එකඟ වූ ප්‍රතිචාර දැක්වුවන්ගෙන් සමහරක් වෙත SLOTහී දී මූලික වශයෙන් ළඟා වී ඇත. ඕනෑම සමීක්ෂණයක් මෙන්, නියැදීමේ සැලසුමෙන් සහ ප්‍රතිචාර නොදැක්වීමෙන් පක්ෂග්‍රාහීත්වයක් ඇති විය හැක, එයින් අදහස් වන්නේ ප්‍රතිචාර දක්වන්නන් අදාළ ජනගහනයේ නියෝජිතයන් නොවන බවයි. වෙනත් ආකාරයකින් සටහන් කර නොමැති නම්, නියැදි සැලසුම් කිරීමේදී සහ ප්‍රතිචාර නොදැක්වීමෙන් සිදුවන නිත්‍ය නැඹුරුතාවයේ දෝෂය පාලනය කිරීමට, වාර්තා කරන ලද ඇස්තමේන්තු සහ විශ්ලේෂණයන් සඳහා ස්ත්‍රී පුරුෂ භාවය, වයස, වාර්ගිකත්වය, ආගම, සමාජ ආර්ථික ශ්‍රේණිගත කිරීම, අධ්‍යාපනය, අංශය සහ භූගෝලීය පිහිටීම අනුව ජාතික ජනගහනයට ගැළපෙන පරිදි ප්‍රවණතා බර අගය සහ පුනරාවර්තන සමානුපාතික සවි කිරීම් (රැකිං) යොදා ගනිමින් බර අගය ගණනය කර ඇති දත්ත භාවිතා කරයි.

© සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය 2021

## සංක්‍රමණය වීමට අවශ්‍ය ශ්‍රී ලාංකිකයන්ගේ සංඛ්‍යාව වැඩි වීම, විශේෂයෙන් තරුණයින් සහ රජය පිළිබඳ අතෘප්තිමත් වූ ඡන්ද දායකයින්

*COVID උපාය මාර්ග සහ ආර්ථික අපේක්ෂාවන් පිළිබඳ අතෘප්තිය සමඟ සම්බන්ධ වූ සාධක, නමුත් විපක්ෂය ප්‍රතිලාභ ලබා ගැනීමට අපොහොසත් වේ*


ආණ්ඩුවට ඡන්දය දුන් තරුණ තරුණියන් විදේශගත වීම සඳහා විදේශ ගමන් බලපත්‍ර ලබා ගැනීමට පෝලිම් ගැසී සිටින බව අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා පසුගියදා නිරීක්ෂණය කළේය.[1] පසුගිය දශක කිහිපය තුළ මිලියන ගණනක් ශ්‍රී ලාංකිකයින් රැකියා සඳහා ස්ථිරව හෝ තාවකාලිකව පිටව යන විගමන සංස්කෘතියක් ශ්‍රී ලංකාවට ඇත, එබැවින් විදේශගත වීමට ඇති කැමැත්ත අලුත් දෙයක් නොවේ, නමුත් විදේශගත වීමට ඇති කැමැත්ත වර්ධනය වී තිබේද?

ශ්‍රී ලංකා අදහස් එකතු කිරීම පිළිබඳව සමීක්ෂණය (SLOTS) දත්ත පෙන්වා දෙන්නේ ශ්‍රී ලාංකිකයන්ගෙන් 27%ක් තමන්ට අවස්ථාවක් ඇත්නම් සංක්‍රමණය වීමට කැමති බවත්, තරුණ හා උගත් අය වැඩිපුරම සංක්‍රමණය වීමට කැමති බවත්ය. විදේශගත වීමට කැමති අයගෙන් 5 දෙනෙකුගෙන් 1 අයෙකු එසේ කිරීමට සැලසුම් කර ඇත, නැතහොත් එය ශ්‍රී ලාංකිකයන් 16කින් 1 අයෙක් ලෙස පෙන්විය හැකිය.

---

### බොහෝ ශ්‍රී ලාංකිකයන් සංක්‍රමණය වීමට කැමති අතර ඒ සඳහා සැලසුම් ඇත

තමන්ට අවස්ථාවක් ඇත්නම් විදේශගත වීමට කැමති බව පවසා ඇති % සහ සංක්‍රමණය වීමට කැමති අයගෙන් දැනටමත් සැලසුම් කර ඇති හෝ ඒ සඳහා සූදානම් වීම ආරම්භ කර ඇති %.




**සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය ශ්‍රී ලංකා අදහස් එකතු කිරීම පිළිබඳව සමීක්ෂණය**


2021 සැප්තැම්බර් 21 - නොවැම්බර් 14 දින දක්වා කාලය තුළ වැඩිහිටියන් 746 දෙනෙකුගේ සමීක්ෂණය කර ඇත—සංක්‍රමණය වීමට ඇති කැමැත්ත පෙන්නුම් කරන උප කුලකයක්—පිළිවෙලින් +/-4% සහ +/-6% දෝෂ ආන්තිකය සමඟ. වැටයීම හේතුවෙන් සංඛ්‍යා 100%ට එකතු නොවිය හැකිය. ආරම්භක සංක්‍රමණ ප්‍රශ්නය සඳහා 2%ක් වූ ප්‍රතිචාර නොදැක්වීම් බැහැර කර ඇත.

SLOTS සමීක්ෂණය අලුත් බැවින් පෙර වසර සමඟ සංසන්දනය කිරීම අපහසුය, නමුත් අනෙකුත් සමීක්ෂණ[2] සමඟ සංසන්දනය කිරීමේදී ගම්‍ය වන්නේ සංක්‍රමණය වීමට කැමති ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව වසර 3-5 කට පෙර සිටි අගය මෙන් දෙගුණයක් විය හැකි බවයි. COVID-19 ට ප්‍රතිචාර වශයෙන් පනවා ඇති ගෝලීය සංචාරක සීමාවන් ඉවත් කළ පසු ශ්‍රී ලංකාවෙන් නීත්‍යානුකූල සහ ලේඛනගත නොවන විභව විගමන පිළිබඳ සාධාරණ දර්ශකයක් ලෙස මෙය භාවිතා කළ හැකිය.

අවස්ථාවක් ලැබුනොත් සංක්‍රමණය වීමට කැමති පුද්ගලයන් සැලකූ විට කාන්තාවන්ට වඩා පිරිමින් වැඩිය, නමුත් සංක්‍රමණය වීමට වැඩි කැමැත්තක් දක්වන කණ්ඩායම් වන්නේ තරුණයින් (වයස අවුරුදු 18-29) සහ විශ්ව විද්‍යාල උපාධිධාරීන් වන අතර එය අවස්ථාවක් ලැබුනොත් සංක්‍රමණය වීමට කැමති පුද්ගලයන් දෙදෙනෙකුගෙන් එක් අයෙක් ලෙස දැක්වේ. උතුරු හා නැගෙනහිර පළාත්වල පුද්ගලයින් පස්දෙනෙකුගෙන් දෙදෙනෙක් අවස්ථාවක් ලැබුණොත් විදේශගත වීමට කැමතිය. කෙසේ වෙතත්, සංක්‍රමණය වීමේ ආශාව, සැබෑ සැලසුම්වලට පරිවර්තනය කිරීමේදී, වඩා හොඳ සහ වඩා උගත් අය සූදානම් වීමට බොහෝ දුරට ඉඩ ඇති බව සඳහන් කළ යුතුය, පුද්ගලික සම්පත් ද ශ්‍රී ලාංකිකයින්ට සංක්‍රමණය වීමට හැකි ප්‍රධාන සාධකයක් බව පෙන්නුම් කරයි.

තරුණයන් විදේශගත වීමට බොහෝ දුරට ඉඩ ඇති බැවින්, විදේශගත වීමට වැඩි කැමැත්තක් දක්වන්නේ තරුණයින්ට බව අගමැති රාජපක්ෂගේ අදහස නිවැරදි බව පෙනෙන්නට තිබුණත්, මෙය රජය සමඟ ඇති අමනාපය නිසා බව නොපෙනේ. නමුත් 2019 සහ 2020 දී ඡන්දය දුන් ආකාරය ගැන ඡන්දදායකයින්ගේ කලකිරීම සැලකිය යුතු ය. 2019 දී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂට (හෝ 2020 දී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට) ඡන්දය දුන් බව පැවසූ ප්‍රතිචාර දක්වන්නන්ගෙන් තුන්දෙනෙකුගෙන් එක් අයෙක් - "කලකිරීමට පත් වූ ගෝඨාභය රාජපක්ෂ ඡන්දදායකයින්" ලෙස මෙහි සඳහන් කර ඇත - අද මැතිවරණයක් පවත්වන්නේ නම් ඔවුන් ඡන්දය දෙන්නේ කෙසේදැයි ඇසූ විට ජනාධිපති රාජපක්ෂ තෝරා ගෙන නැත. ඇතැමුන් වෙනත් පුද්ගලයන්ව දක්වා ඇති නමුත් බොහෝ දෙනා ප්‍රතිචාර දැක්වූයේ ඔවුන් ඡන්දය ප්‍රකාශ නොකරන බව හෝ පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරන බවයි, එයින් ඇඟවෙන්නේ රජය සමඟ ඇති අතෘප්තියෙන් වැඩි ප්‍රමාණයක් විපක්ෂයට සහය දැක්වීමක් බවට තවමත් පරිවර්තනය වී නොමැති බවයි. සංක්‍රමණය වීමට ඇති ආශාව වැඩි වීම, දේශපාලන ක්‍රමයට යහපත් වෙනසක් ලබා දීමට ඇති හැකියාව පිළිබඳ පුළුල් බලාපොරොත්තු සුන්වීමක් පිළිබිඹු කළ හැකි බව ද එය යෝජනා කරයි.

**වඩා උගත් සහ කලකිරුණු ගෝඨාභය රාජපක්ෂ ඡන්දදායකයින් සංක්‍රමණය වීමට වැඩි ඉඩක් ඇත.**
*2019 ජනාධිපතිවරණයේදී ගෝඨාභය රාජපක්ෂ මහතාට ඡන්දය දුන් බව වාර්තා කරන සියලුම වැඩිහිටියන් හා සංක්‍රමණය වීමට ඇති කැමැත්ත කෙරෙහි සාධකවල සාපේක්ෂ බලපෑම.*





**සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය ශ්‍රී ලංකා අදහස් එකතු කිරීම පිළිබඳව සමීක්ෂණය**
සියළු දෙනාටම සංක්‍රමණය වීමට ඇති අවශ්‍යතාවයේ සාපේක්ෂ සම්භාවිතාව තීරු වලින් පෙන්නුම් කරයි. ස්ත්‍රී පුරුෂ භාවය, වයස, අධ්‍යාපනය, ජනවාර්ගිකත්වය, ආර්ථික මට්ටම, පළාත සහ පදිංචි වී සිටින පෙදෙස යන සාධක මත එම ඇස්තමේන්තුගත බලපෑම් පදනම් වී ඇති අතර එම එක් එක් සාධකයේ ස්වාධීන බලපෑම මෙමගින් නිරූපණය වේ. නිදසුනක් වශයෙන්, නාගරික ප්‍රදේශවල ජීවත් වන ජනතාව, ග්‍රාමීය ජනතාව මෙන් 2.0 ගුණයක් (හෝ 100% කට වැඩි) අනෙකුත් සාධක සැලකිල්ලට ගැනීමෙන් පසු සංක්‍රමණය වීමට කැමැත්තක් දක්වයි. පිරවූ තීරු සියයට 10ක සංඛ්‍යානමය වශයෙන් සැලකිය යුතු ලෙස වැදගත් වන අතර, කුහර තීරු සංඛ්‍යානමය වශයෙන් වැදගත් නොවේ, ඒ අතර * මගින් 5%ක සහ ** මගින් 1%ක වැදගත්කම පෙන්නුම් කරයි. 2021 සැප්තැම්බර් 21 සිට නොවැම්බර් 14 දක්වා කාලය ඇතුළත වැඩිහිටියන් 746 දෙනෙකු සහභාගී කරගෙන සිදුකල සමීක්ෂණයෙන් 2019 ජනාධිපතිවරණයේදී ගෝඨාභය රාජපක්ෂට ඡන්දය දුන් බව පැවසූ සහ සංක්‍රමණය පිළිබඳ ප්‍රශ්නවලට පිළිතුරු සැපයූ 220ක උප කුලකය.

සියලුම සාධක එකවර සැලකිල්ලට ගත් විට, විදේශගත වීමට ඇති කැමැත්ත සඳහා සැලකිය යුතු ස්වාධීන බලපෑමක් ඇත්තේ සමහරුන්ට පමණි.[3] මේ සඳහා තරුණ, පිරිමි, වඩා උගත්, උතුරු හා නැගෙනහිර පළාත්වල සහ නාගරික ප්‍රදේශවල ජීවත් වීම සහ ආර්ථික වශයෙන් වඩා හොඳ තත්ත්වයක සිටීම ඇතුළත් වේ. එහෙත් රාජපක්ෂ ජනාධිපතිවරයාට ඡන්දය දුන් වැඩිහිටියන් අතර, විදේශගත වීමට ඇති කැමැත්තට වඩා ප්‍රබල ලෙස බලපා ඇත්තේ වඩා උසස් උපාධියක් සහිත උගත්කම සහ ඉහළ ආදායමක් ලැබීමයි, නමුත් කලකිරුණු රාජපක්ෂ ඡන්දදායකයින් අතර, අනෙක් රාජපක්ෂ ඡන්දදායකයින්ට වඩා විදේශගත වීමට ඇති කැමැත්ත තුන් ගුණයකින් වැඩිය - මෙහි සඳහන් වන්නේ "පක්ෂපාතී ගෝඨාභය රාජපක්ෂ ඡන්දදායකයින්" යනුවෙනි. ආණ්ඩුව කෙරෙහි ඇති කලකිරීම හේතුවෙන් පෙර සිටි ආධාරකරුවන් සංක්‍රමණයට යොමු කෙරෙනු අතර සංක්‍රමණය වීමට වැඩිපුරම යොමු කරනු ලබන්නේ වඩා උගත් සහ වඩා හොඳ රාජපක්ෂ ඡන්දදායකයින් බව කියවෙන අගමැති රාජපක්ෂගේ දෙවන කරුණ මෙයින් සනාථ වෙයි.

එම කලකිරීමට ආර්ථිකය පිළිබඳ අශුභවාදී බව සහ COVID-19 ප්‍රතිචාරය පිළිබඳ අතෘප්තිය ප්‍රධාන වශයෙන් දායක වන බව පෙනේ. කලකිරුණු රාජපක්ෂ ඡන්දදායකයින් තම ගෘහ ආර්ථික තත්ත්වය තක්සේරු කරන්නේ පක්ෂපාතී රාජපක්ෂ ඡන්දදායකයින්ට වඩා වෙනස් ලෙස නොවේ, 66%ක් තම පවුලේ තත්ත්වය වසරකට පෙර වඩා නරක

බව වාර්තා කරන අතර පක්ෂපාතී ඡන්දදායකයින් ගෙන් 56%ක් එලෙස වාර්තා කරයි, එය සියලුම වැඩිහිටියන් සැලකූ අවස්ථාවට වඩා සුළු වශයෙන් වෙනස් වේ (65%). කෙසේ වෙතත්, කලකිරුණු රාජපක්ෂ ඡන්දදායකයින් ආර්ථිකය සම්බන්ධ අපේක්ෂාවන් පිළිබඳව වඩාත් අශුභවාදී වන අතර, සමස්ත පොදු ජනගහනයට (72%) සාපේක්ෂව ඔවුන් අඩු අශුභවාදී වුවද 66%ක් පවසන්නේ වසරක් ඇතුළත ආර්ථිකය නරක අතට හැරෙනු ඇතැයි තමන් අපේක්ෂා කරන බවයි, [4]නමුත් පක්ෂපාතී ඡන්දදායකයින්ගෙන් 59%ක් පමණක් මෙසේ අපේක්ෂා කරයි. තවද මෙය 2019 ජනාධිපතිවරණයට මදක් පෙර සිට මහජන සුබවාදීත්වයේ සම්පූර්ණ බිඳ වැටීමක් පෙන්නුම් කරන නමුත් ශ්‍රී ලාංකිකයන්ගෙන් 56% ක් වසරක් ඇතුළත ආර්ථිකය යහපත් වනු ඇතැයි අපේක්ෂා කරන බව ප්‍රකාශ කළහ.[5]

**කලකිරුණු රාජපක්ෂ ඡන්දදායකයින් හිතවත් අයට වඩා ආර්ථිකය ගැන අශුභවාදීය.**




සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය ශ්‍රී ලංකා අදහස් එකතු කිරීම පිළිබඳව සමීක්ෂණය


ප්‍රශ්න දෙක සඳහා පිළිවෙලින් 19% සහ 3% වූ ප්‍රතිචාර නොදැක්වීම් ඉවත් කර ඇත. 2021 සැප්තැම්බර් 21 සිට නොවැම්බර් 14 දක්වා කාලය තුළ වැඩිහිටියන් 746 දෙනෙකු සහභාගී කරගෙන සිදුකල සමීක්ෂණයෙන් 2019 ජනාධිපතිවරණයේදී ගෝඨාභය රාජපක්ෂට ඡන්දය දුන් බව පැවසූ සහ ආර්ථිකය පිළිබඳ ප්‍රශ්නවලට පිළිතුරු දුන් පිරිසගේ උප කුලකය. වැටයිම හේතුවෙන් සංඛ්‍යා දත්ත 100% දක්වා එකතු නොවිය හැක.

ආණ්ඩුවේ කොවිඩ්-19 කෙරෙහි ප්‍රතිචාරය ගැන විශ්වාසවන්ත ඡන්දදායකයින්ට වඩා කලකිරුණු රාජපක්ෂ ඡන්දදායකයින් අඩු තෘප්තිමත් භාවයකින් පසුවෙති. ඔවුන් රජයේ කොවිඩ්-19 කෙරෙහි ප්‍රතිචාරය තක්සේරු කරන්නේ කෙසේදැයි විමසූ විට, එය හොඳ යැයි තක්සේරු කරන්නේ 47%ක් පමණක් වන අතර, එය පක්ෂපාතී ඡන්දදායකයින්ට වඩා අඩුය (74%). අනාගතයේදී වඩා ශක්තිමත් කොවිඩ්-19 පාලනයකට ඔවුන් කැමැත්තෙන් සිටී. රටේ සංචරණ සීමාවන් ඉවත් කරන විට කොවිඩ්-19 මරණ කීයක් පිළිගත හැකිද යන්න විමසූ විට, අඩකට ආසන්න කලකිරුණු ඡන්දදායකයින් (46%) පවසන්නේ වසරකට මරණ 100 කට වඩා අඩු ප්‍රමාණයක් පිළිගත හැකි බව වන අතර පක්ෂපාතී ඡන්දදායකයින්ගෙන් 77%ක් වැඩි මරණ ප්‍රමාණයක් අපේක්ෂා කරන අතර ඔවුන්ගෙන් තුනෙන් දෙකක් වසරකට මරණ 1,000ක් හෝ ඊට වැඩි ගණනක් පිළිගත හැකි යැයි සලකති.

වෛරසය වැඩි වශයෙන් පාලනය කිරීම සඳහා කලකිරුණු රාජපක්ෂ ඡන්දදායකයින්ගේ මෙම මනාපය වෙනත් මතවලින් පිළිබිඹු වේ. වෙනත් ප්‍රශ්න කිහිපයකට අදාල ප්‍රතිචාර ඒකාබද්ධ කරන හොඳ වෛරස් පාලනයක් සඳහා

මනාප සංයුක්ත දර්ශකයක් [6] පෙන්නුම් කරන්නේ කලකිරුණු ඡන්දදායකයින්, විශ්වාසවන්ත ඡන්දදායකයින්ට වඩා වෛරසය පාලනය කිරීමට වැඩි කැමැත්තක් දක්වන බවයි. කොවිඩ්-19 පාලනය පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන්, ඔවුන්ගේ අදහස් ප්‍රායෝගිකව සමස්ත මහජනතාවගේ සහ ජනාධිපති රාජපක්ෂට ඡන්දය නොදුන් අයගේ අදහස් හා සමාන වේ. එයින් පැහැදිළි වන්නේ 2021 මුල් භාගයේ සිට COVID-19 ව්‍යාප්තිය නිල වශයෙන් වැඩියෙන් දරා ගැනීම හේතුවෙන් රජයට සැලකිය යුතු සහයෝගයක් අහිමි වූ බවයි.

**කලකිරුණු ගෝඨාභය රාජපක්ෂ ඡන්දදායකයින් ආර්ථිකය ගැන වඩාත් අශුභවාදීව සලකයි, රජයේ කොවිඩ්-19 ප්‍රතිචාරය නරක යැයි ශ්‍රේණිගත කරයි, විශ්වාසවන්ත රාජපක්ෂ ඡන්දදායකයින්ට වඩා අඩු කොවිඩ්-19 මරණ පිළිගැනීමට කැමැත්තෙන් සිටිති.**




සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය ශ්‍රී ලංකා අදහස් එකතු කිරීම පිළිබඳව සමීක්ෂණය

ප්‍රශ්න දෙක සඳහා පිළිවෙලින් 5% සහ 28% වූ ප්‍රතිචාර නොදැක්වීම් ඉවත් කර ඇත. 2021 සැප්තැම්බර් 21 සිට නොවැම්බර් 14 දක්වා කාලය තුළ වැඩිහිටියන් 746 දෙනෙකු සහභාගී කරගෙන සිදුකල සමීක්ෂණයෙන් 2019 ජනාධිපතිවරණයේදී ගෝඨාභය රාජපක්ෂට ඡන්දය දුන් බව පැවසූ සහ කොවිඩ්-19 ප්‍රතිචාරය පිළිබඳ ප්‍රශ්නවලට පිළිතුරු දුන් පිරිසගේ උප කුලකය. වැටයිම හේතුවෙන් සංඛ්‍යා දත්ත 100% දක්වා එකතු නොවිය හැක.

සාරාංශයක් ලෙස, ශ්‍රී ලංකාවේ අදහස් නිරීක්ෂණ සමීක්ෂණයේ ප්‍රතිචාර මගින් ශ්‍රී ලාංකිකයන්, විශේෂයෙන් තරුණ තරුණියන් සංක්‍රමණය වීමට උත්සාහ කිරීමේ වැඩිවීමක් පවතින බවට අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂගේ ප්‍රකාශය සනාථ කරන අතර, මෙයින් වැඩි ප්‍රමාණයක් ඡන්දදායකයින් තුල ඇති කළකිරීම හේතුවෙන් සිදු වන බව ද ඒවා මගින් සනාථ වේ. මෙම අතෘප්තිය හේතුවෙන් බොහෝමයක් ආර්ථික අපේක්ෂාවන් පිළිබඳ අශුභවාදී බව සහ කොවිඩ්-19 කෙරෙහි ප්‍රතිචාරය පිළිබඳ අතෘප්තිය, විශේෂයෙන් "වෛරසය සමඟ ජීවත් වීම" වෙනුවට කොවිඩ්-19 වඩා ශක්තිමත් ලෙස පාලනය කිරීමට ඇති කැමැත්ත මෙමගින් පෙන්වා දෙයි. මෙයින් ආණ්ඩුවට ඇති එකම සාධනීය පැත්ත විය හැක්කේ බොහෝ කලකිරුණු රාජපක්ෂ ඡන්දදායකයින් තම සහයෝගය වෙනත් පක්ෂවලට මාරු කර ඇති බවක් නොපෙනීම විය හැකි නමුත් මෙය කාලය පිළිබඳ ප්‍රශ්නයක් පමණක් විය හැකිය. කෙසේ වෙතත්, ජාතික දෘෂ්ටිකෝණයකින් බලන කල, ගෝලීය සංචරණ සීමා ඉවත් වීමත් සමග, තරුණයින් සහ සමාජයේ

වඩාත්ම උගත් සහ ධනවත් පිරිස අතර සංක්‍රමණය වීමට ඇති දැඩි පීඩනය, ගෝලීය සංචලනය වැඩිදියුණු වන විට රටේ අනාගත ආර්ථික හා සමාජීය අපේක්ෂාවන්ට අහිතකර ලෙස බලපායි.

## තාක්ෂණික සටහන්

[1] 2021 නොවැම්බර් 2 වන දින ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ (SLPP) පස්වන සංවත්සරයේ ප්‍රකාශය.

[2] SLOTS සංක්‍රමණ ප්‍රශ්න ශ්‍රී ලංකාව ඇතුළුව රටවල් 100කට වැඩි ගණනක පවත්වන ලද Gallup World මත විමසුමෙන් ලබාගෙන ඇති අතර ඒවායේ දත්ත සත්‍ය සංක්‍රමණ ප්‍රවාහයන් සමඟ හොඳින් අනුරූප වේ.

[3] විවිධ සාධක සහ ජනවිකාස, විචල්‍යයන් ලෙස ඇතුළත් කරමින් ප්‍රතිගාමී විශ්ලේෂණය මගින් සංක්‍රමණය වීමට ඇති කැමැත්ත මත විවිධ සාධකවල ස්වාධීන බලපෑම පිළිබඳ ඇස්තමේන්තු ව්‍යුත්පන්න කර ඇත. වාර්තා කරන ලද ආකෘති දෙක සඳහා සම්භාවිතා අනුපාත chi-squares පිළිවෙළින් $\chi 2=72.3$, $p<.0001$ සහ $\chi 2=53.3$, $p=<.0001$ වේ.

[4] ඉදිරි මාස 12 ගැන බලාපොරොත්තු සඳහා ප්‍රතිචාර ඇත. එසේ නොමැති නම් වසර පහක කාලය තුළ ආර්ථිකය පිළිබඳ අපේක්ෂාවන් ගැන අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු ඇතුළත් වේ.

[5] ඔක්.-නොවැ. 2019 පැවති ශ්‍රී ලංකා සෞඛ්‍ය හා වයස්ගත වීම පිළිබඳ (SLHAS) පළමු සමීක්ෂණයේ සොයාගැනීම්.

[6] අසන ලද ප්‍රශ්නවලට අදාළ ප්‍රතිචාර, සංයුක්ත දර්ශකය මගින් ඒකාබද්ධ කරයි: (i) ව්‍යාපාරවලට සහ මිනිසුන්ට සාමාන්‍ය පරිදි වැඩ කිරීමට ඉඩ හැරීමට එරෙහිව වෛරසය පාලනය කිරීම පිළිබඳ වත්මන් මනාපයන්; (ii) 2021 අගෝස්තු අගුලු දැමීම මීට පෙර හෝ පසුව ආරම්භ කළ යුතුව තිබුණේද; (iii) ඉදිරි වසර තුළ වෛරසය මර්දනය කිරීම හෝ එය සමඟ ජීවත් වීම අතර ඇති ගනුදෙනුව; සහ (iv) ඉදිරි වර්ෂයේදී ප්‍රතිචාර දැක්වූවන් විසින් පිළිගත හැකි යැයි සිතන COVID-19 මරණ සංඛ්‍යාව.